# ජනතා වතු සංවර්ධන මණ්ඩලය
# වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය
# ඇබෑර්තු

ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. තෝරාගන්නා ලද අයදුම්කරුවන් රජය විසින් නිකුත් කරන ලද හා ඉදිරියේදී නිකුත් කිරීමට අපේක්ෂිත අණ පණත් හා ආයතනික නීති රීති, රෙගුලාසි හා ප්‍රතිපත්තිවලට අනුකූලව තනතුරට අදාල කාර්යයන් ඉටුකිරීමට මනා හැකියාවක් ඇති අය විය යුතුය.

## <u>සහකාර වතු අධිකාරී - 04 තනතුරු</u>

**තනතුරට පැවරෙන කාර්යයන් :-**

ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ කර්මාන්තශාලා/වතු වලට ( තේ,රබර්,පොල්) අදාළව අභිමතාර්ථ සහ අරමුණු සාක්සාත් කරගැනීම සඳහා ප්‍රතිපත්ති සැලසුම් කිරිම, නිර්දේශ කිරිම, කර්මාන්තශාලා/වතු දෛනිකව පවත්වාගෙන යාම උදෙසා අවශ්‍යතා හඳුනාගැනීම, මෙහෙයවීම, අධීක්ෂණය, ඇගයීම හා අදාළ අංශ සම්බන්ධීකරණය කිරිම වතු/කර්මන්තශාලා කාර්යය මණ්ඩලයේ කාර්යාල පාදක අවශ්‍යතා හඳුනාගැනීම හා ක්‍රියාත්මක කිරිම පිණිස වතු අධිකාරීට සහය වීම.

**සුදුසුකම් හා පළපුරුද්ද**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යාවේදී/වැවිලි කළමනාකරණය/කෘෂිකර්මය හෝ නිෂ්පාදන කළමනාකරණ උපාධියක් ලබා තිබීම.

සහ

උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එකක (01) පළපුරුද්දක් ලබා තිබීම.

**වැටුප් පරිමාණය :-**

**සේවා ගණය** : " මධ්‍යම කළමනාකාර"

**වැටුප් තලය** : MM 1-1/11 රු. (53,175 -10x1,375 – 15x1,910-95,575) හා සේවක අර්ථසාධක අරමුදල්, සේවා නියුක්තියන්ගේ භාර අරමුදල්, ජීවන වියදම් දීමනා හා රජය විසින් දෙනු ලබන අනෙකුත් දීමනා.

**වයස** :- අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර 45 ට නොවැඩි විය යුතුය.

## නීති නිලධාරී (කොන්ත්‍රාත්) – 02 තනතුරු

**තනතුරට පැවරෙන කාර්යයන් :-**

ඉල්ලීම් ලිපි, අපහාසාත්මක නඩු, අභියාචනා සහ නඩු සංශෝධන, මූලික අයිතිවාසිකම් කරුණු, ඉඩම් නඩු සහ කරුණු හැසිරවීම, ඉහත කරුණු සඳහා අධිකරණවල පෙනී සිටීම, ගිවිසුම්, කොන්ත්‍රාත්තු, මණ්ඩල පත්‍රිකා සහ වෙනත් නීති කෙටුම්පත් සකස් කිරීම.

**සුදුසුකම් සහ පළපුරුද්ද:**

නීතිඥවරයෙකු සහ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු වීම. පිළිගත් විශ්ව විද්‍යාලයකින් නීති උපාධිය (LLB) අමතර සුදුසුකමකි. සිංහල සහ ඉංග්‍රීසි භාෂාවලින් නොතාරිස්වරයෙකු හා නීතිඥවරයෙකු ලෙස කටයුතු කිරීමට අවම වශයෙන් අවුරුදු තුනක (03) පළපුරුද්දක් සහ බලයක් තිබීම. ගිවිසුම් කෙටුම්පත් කිරීමේ පළපුරුද්ද අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ. කම්කරු ගැටළු, කම්කරු විනිශ්වය සහා, කම්කරු විමර්ශන, කම්කරු විමර්ශන සහ ඉඩම් ආශ්‍රිත නඩු/ගැටළු හැසිරවීමේ පළපුරුද්ද ඇති අයදුම්කරුවන්ට වැඩි ප්‍රමුඛත්වයක් ලබා දෙනු ලැබේ.

**වැටුප් සහ දීමනා :**

වැටුප සාකච්ඡා කළ හැකිය. සේවක අර්ථසාධක අරමුදල්, සේවා නියුක්තියන්ගේ භාර අරමුදල්, ජීවන වියදම් දීමනා හා රජය විසින් දෙනු ලබන අනෙකුත් දීමනා.

**වයස:**

අවුරුදු 28 ට නොඅඩු සහ අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

## කළමනාකරණ සහකාර (කොන්ත්‍රාත් ) (තාක්ෂණික නොවන) – 02 තනතුරු

**සුදුසුකම් හා පළපුරුද්ද**

**අධ්‍යාපන**

**(අ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී**

i. සිංහල/ දෙමළ

ii. ගණිතය

iii. ඉංග්‍රීසි භාෂාව යන විෂයන් ඇතුළුව විෂයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හය (06) කින් සමත්ව තිබීම.

(ආ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයන් තුනක් (සාමාන්‍ය පොදු පරික්ෂණය හැර ) සමත්ව තිබීම.

**පළපුරුද්ද**

පොත් තබන්නා තනතුරෙහි අවම වශයෙන් අවුරුදු 03 ක පළපුරුද්දක් ලබා තිබීම හෝ මුදල් අයකැමි තනතුරෙහි අවම වශයෙන් වසර 03 ක පළපුරුද්දක් ලබා තිබීම විශේෂ සුදුසුකමක්සේ සලකනු ලැබේ.

**වැටුප් සහ දීමනා :**

වැටුප සාකච්ඡා කළ හැකිය. සේවක අර්ථසාධක අරමුදල්, සේවා නියුක්තියන්ගේ භාර අරමුදල්, ජීවන වියදම් දීමනා හා රජය විසින් දෙනු ලබන අනෙකුත් දීමනා

වයස:

අවුරුදු 35 ට නොඅඩු සහ අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

වෙනත් :

සෑම අයදුම්කරුවෙකුම

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

II. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

III. විශිෂ්ඨ චරිතයෙන් යුක්ත විය යුතුය.

IV. අනුමත බඳවා ගැනීමේ පටිපාටියට අනුව සියළුම අවශ්‍යතාවයන් සපුරාලිය යුතුය.

සුදුසුකම් ඇති අයදුම්කරුවන් සඳහා සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුසු නිළධාරියෙකු තෝරා ගනු ඇත. අයදුම්කරු පිළිබඳ තොරතුරු විමසිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම්ද සහිතව යාවත්කාලීන කරන ලද අයදුම්පත් 2025.03.04 වන දින හෝ ඊට ප්‍රථම සභාපති, ජනතා වතු සංවර්ධන මණ්ඩලය, 55/75, වොක්ෂෝල් පටුමග, කොළඹ 02 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර ඉල්ලුම් කරන ලද තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙලවරෙහි සඳහන් කල යුතුය.

සභාපති
ජනතා වතු සංවර්ධන මණ්ඩලය
2025.02.18